බප/ජය අනුලා විද්‍යාලය - නුගේගොඩ
පළමුවන වාර පරීක්ෂණය - 2013
මව්බස
4 ශ්‍රේණිය

නම : .................................................................... කාලය පැය 1 ½ යි

(01) ඡේදය කියවා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"උස් ගස්වල ටිකිලි ඇතුන්ගේ ආහාරයකි. හොඬවැල ඔසවා ගත් කල්හි එයට අසු නොවන තරම් උස් වූ ටිකිලි වෙතොත් , පාදයෙන් ඇන එම ගස උදුරා හෝ පෙරළා හෝ දමා එම කොළ ටිකිලි කෑම ඇතාගේ සිරිතය. දිවීමෙහි ශූරයෙකු වූ වල් අලි මිනිසුන්ට වඩා වේගයෙන් දුවති. එහෙත් හීලෑ ඇතුන් හට නම් එතරම් වේගයෙන් දුවන්නට බැරිය."

1). මෙම ඡේදයෙන් කියවෙන්නේ කවුරුන් පිළිබඳවද?..............................
2). ඇතුන්ගේ ආහාරය කුමක්ද?..............................
3). උස් ටිකිලි ඇතුන් කඩන්නේ කෙසේද?..............................
4). වල් අලින්ගේ විශේෂත්වය කුමක්ද?..............................
5). ඇතුන්ට ගස් පෙරළීමට උපකාර වන්නේ කුමක්ද?..............................

(ලකුණු 2x5=10)

(02) ලිඛිත බසට හරවා ලියන්න.

1) කුරුල්ලෝ අහසේ පියාසර කරනවා.
..............................
2) ඈ දර කඩන්න කැලයට ගියා.
..............................
3) අපි ගොයම් කැපුවා.
..............................
4) රුවන් අහස දෙස බලනවා.
..............................
5) බල්ලා සඳට බුරනවා.
..............................

(ලකුණු 2x5=10)

(03) වරහන් තුළින් අඩු අකුරු තෝරා ගෙන හිස් තැන් පුරවන්න.

i. පම...... ( න , ණ )
ii. පු......පය ( ස් , ෂ් )
iii. විශේ...... ( ස , ෂ )
v. විශිෂ්...... ( ඨ, ට )
vi. විෂ්කම්......ය ( බ , භ )
vii. වි......මය ( ස් , ශ් )
viii. කොටි......සය ( ඨා , ටා )
ix. අන්......කාරය ( ධ , ද )
x. නාම ලේ......නය ( ඛ , ක )

(ලකුණු 1x10=1

(04) පහත සඳහන් සිදුවීමේ අනුපිළිවෙළ අනුව පහත වාක්‍ය වලට ඉදිරියෙන් ගැලපෙන ලෙස අංක යොදන්න.

1) ස්තුති කතාව ( )
2) පොල්තෙල් පහන දැල්වීම. ( )
3) ත්‍යාග ප්‍රදානය කිරීම. ( )
4) ආරාධිත අමුත්තන් පිළිගැනීම හා කැඳවාගෙන ඒම. ( )
5) පිළිගැනීමේ කතාව ( )
6) ප්‍රධාන ආරාධිතයාගේ කථාව ( )

(ලකුණු 2x6=

(05) පහත දැක්වෙන තේරවිලි විසඳා තිත් ඉරිමත ලියන්න.

1) මූණේ තිබෙන රට - ..............................
2) මල්ලේ තිබෙන රට - ..............................
3) කෑවොත් පලතුරක් කැපුවොත් මරණයක් - ..............................
4) කැලේ රජා කවුද යාළු - ..............................

(ලකුණු 2x4

(06) පහත සඳහන් කෙටි යෙදුම් වලින් දැක්වෙන අදහස ඉදිරියෙන් ලියන්න.

1) බු.ව. - ..............................
2) නි.වි. - ..............................
3) පෙ.ව. - ..............................
4) ප.ව. - ..............................

(ලකුණු 2x4

(07) මුලින් දී ඇති වචනයට ගැලපෙන විරුද්ධ පදය දී ඇති පිළිතුරු අතරින් තෝරා ඉරක් අඳින්න.

1) සීත - ( උෂ්ණ , සිසිල , සෞම්‍ය )
2) පිපෙයි - ( විකසිතවෙයි , පරවෙයි , දිදිලෙයි )
3) ජයග්‍රහණය - ( පරාජය , දිනුම , ප්‍රථම ස්ථානය )
4) ශීලාචාර - ( අශීලාචාර , අවිනීත , විනීත )
5) ගැළපෙන - ( යාවන , නොගැළපෙන , සසඳෙන )

(ලකුණු 2x5

(08) මුලින් දී ඇති වචනයට ගැළපෙන සමාන පදය බැගින් ලියන්න.

1) යහළුවා - ..............................
2) මුහුද - ..............................
3) කාන්තාව - ..............................
4) රජ - ..............................
5) වනය - ..............................

(ලකුණු 2x5=10)

(09) හිස් තැනට සුදුසු ආඛ්‍යාතය පද වරහන් තුළින් තෝරා ලියන්න.

1) අශ්වයෝ වේගයෙන් ..................
2) අපි පාඩම් ..................
3) මම ගමට ..................
4) අක්කා පොත ..................
5) තාත්තා වැඩට ..................

( කියෙව්වාය , ගියෙමි , කළෙමු , ගියේ ය , දිවූහ )

(ලකුණු 2x5=10)

(10) " මගේ රට " ගැන වාක්‍ය 6 ක් ලියන්න.

01)..............................
..............................
02)..............................
..............................
03)..............................
..............................
04)..............................
..............................
05)..............................
..............................
06)..............................
..............................